# බෞද්ධ සංස්කෘතිය

# දහම් පාසල් අවසානය

# 2023 දක්වා ප්‍රශ්න

## 01 බෞද්ධ සිරිත් විරිත් වල පදනම

### :2019/2020

(3)i. සීලයෙහි අරමුණ හා වැදගත්කම දක්වන්න.

ii. චතු පාරිශුද්ධි ශීල නම් කොට එයින් එකක් විස්තර කරන්න.

iii. උපෝසථ අෂ්ටාංග සීලය හඳුන්වා පංච ශීලයට වඩා එහි දක්නට ලැබෙන විශේෂතා පැහැදිලි කරන්න.

### 2017/2018

(1)i. පැවිදි හා ගිහි යන දෙපක්‍ෂයට අදාළ සීලය වර්ගීකරණයට භාජනය කරමින් සීල ප්‍රතිපදාවේ පෙනෙන විශේෂතා විමශර්නය කරන්න.

ii,හිරි ඔතප් කවරේදැයි හඳුන්වා,මේ ධර්ම දෙක සීලය සමඟ සම්බන්ධ වන ආකාරය දක්වන්න.

iii. සිත හා ප්‍රඥාව දියුණු කරන බුද්ධිමත් පුද්ගලයා අවසාන විමුක්තිය ලබා ගැනීම සඳහා සීලය පාදක කොටගෙන අනුගමනය කළ යුතු ප්‍රතිපදාව ආර්‍ය අෂ්ටාංගික මාගර්ය ඇසුරින් පැහැදිලි කරන්න.

2015/2016

(1)i. බුදුරජාණන් වහන්සේ විසින් සිය ශ්‍රාවකයන් උදෙසා ශික්‍ෂාපද පැනවීමට හේතු වූ අරමුණු කවරේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. නිවර්ාණාවබෝධය සඳහා බෞද්ධ ගිහි පැවිදි දෙපක්ෂයටම මධ්‍යම ප්‍රතිපදා මාගර්ය අනුගමනය කිරීමේදී මතුවී පෙනෙන විශේෂතා පිළිබඳ සමාලෝචනයක් කරන්න.

### 2014/2015

(1)අ. බෞද්ධ විමුක්ති මාගර්ය ශීල සමාධි ප්‍රඥා යන පියවර තුන තුනක් යටතේ සකස් වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

ආ. සදාචාරාත්මක පැවැත්ම හා සීලය අතර පවත්නා සම්බන්ධතාවය විමශර්නය කරන්න.

ඉ. චාරිත්‍ර ශීලය හා වාරිත්‍ර ශීලය හඳුන්වා මේ දෙකෙහි ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන සාධක විභාග කරන්න.

## 2013/2014

(1)අ. ලෝක පාලක ධර්ම හඳුන්වා ඒ මත සදාචාර ලෝකයේ පැවැත්ම රඳා පවත්නා ආකාරය දක්වන්න.

ආ. සංසාර විමුක්තිය උදෙසා බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ ක්‍රියාමාගර්ය හා මධ්‍යම ප්‍රතිපදාව අතර පවත්නා සම්බන්ධතාව විස්තර කරන්න.

ඉ. චතු පාරිශුද්ධ ශීලය විස්තර කරන්න.

(2)අ. ගෘහස්ථයන් විසින් සමාදන් වීමට යෝග්‍ය සේ දැක්වෙන විවිධ ශීල ප්‍රභේද කෙටියෙන් හඳුන්වන්න.

ආ. බෞද්ධ ගිහියාගේ හා පැවිද්දාගේ අරමුණු ලෙස සැලකෙන්නේ සංසාර විමුක්තිය වුවත් මේ දෙපක්ෂයේ කාර්‍ය්‍යය අතර වෙනසක් දක්නට ලැබේ විමසන්න.

ඉ. බුදුරජාණන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන් උදෙසා ශික්‍ෂා පද පැනවීමේ දී ඉදිරිපත් කළ හේතු සාධක කවරේදැයි පැහැදිලි කරන්න.

## 2012/2013

(1)අ. සීලයෙහි පදනම වන හිරි ඔත්තප්ප දෙකෙහි පවත්නා වැදගත්කම පැහැදිලි කරන්න.

ආ. පුද්ගල ප්‍රභේදතා අනුව ගිහි පැවිදි දෙපක්‍ෂයට අයත් සීලය බෙදා දක්වන්න.

ඉ. නිවර්ාණාවබෝධය උදෙසා ශීලය පදනම් වන ආකාරය ආර්‍ය්‍ය අෂ්ටාංගික මාගර්යේ ඉගැන්වීම් ආශ්‍රයෙන් තහවුරු කරන්න.

## 2011/2012

(1)අ. චාරිත්‍ර සීලය හා වාරිත්‍ර සීලය හඳුන්වා මේ දෙකෙහි පවත්නා විශේෂතා පැහැදිලි කරන්න.

ආ. ගෘහස්ථ සමාජයේ ධාර්මිකත්වය හා සංවර සීලයේ පැවැත්ම උදෙසා සීලය හේතු වන ආකාරය දක්වන්න.

ඉ. පැවිදි පක්ෂය විසින් පිළිපැදිය යුතු චතු පාරිශුද්ධ ශීලය කවරේදැයි පැහැදිලි කරන්න.

## 2010/2011

(1)අ. ලෝක පාලක ධර්ම හෙවත් දේව ධර්මය නම් කරන්න.

ආ. ගිහි පැවිදි දෙපක්ෂය සඳහා වූ සීලය කීවදෑරුම් ද ඒවා නම් කරන්න.

ඉ. ගුණගරුක සමාජයක් ගොඩනැගීම සඳහා බෞද්ධ සිරිත් විරිත් උපයෝගී වන අයුරු සාකච්ඡා කරන්න.

## 2009/2010

(1)අ. බෞද්ධ ගිහියා විසින් නිත්‍ය වශයෙන්ම රැකිය යුතු යැයි නිර්දිෂ්ඨ ශීලය කී වැදෑරුම්ද ඒවා නම් කරන්න.

ආ. ආර්‍ය මාගර්යේ අංග අට පිළිවෙලින් නම් කරන්න.

ඉ. ආර්‍ය මාර්ගයේ ගමන් කිරීමෙන් නිවන් පසක් කර ගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

## 2008/2009

(1)අ. සීලයෙහි ප්‍රභේද නම් කරන්න.

ආ. සීලයෙහි හික්මීමට හේතුවන ධමර්තා කීවැදෑරුම්ද ඒ මොනවාද?

ඉ. සීලවන්ත පුද්ගලයාගෙන් සමාජයට විය හැකි මෙහෙවර පිළිබඳව ඇගැයීමක් කරන්න.

2007/2008

(1)අ. පුද්ගල ප්‍රභේදය අනුව ගිහියන් හා පැවිද්දන් සඳහා වූ ශීලය කී වැදෑරුම්ද ඒවා නම් කරන්න.

ආ. සිරිත් විරිත් පවත්වා ගැනීමේ අභිමතාථර් කී වැදැරුම්ද ඒවායින් තුනක් නම් කරන්න.

ඉ. ලෝකයේ පැවැත්ම සඳහා උපකාරී වන ලෝකපාලක ධර්ම පිළිබඳව ඇගයීමක් කරන්න.

## 2006/2007

(1)අ. සීලයේ කොටස් දෙක නම් කොට ඉන් එකක් පිළිබඳව ඇගැයීමක් කරන්න.

ආ. ප්‍රාතිමෝක්ෂ සංවර සීලය සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට ඉවහල් වන ආකාරය පහදා දෙන්න.

## 2005

(1)අ. සීලය ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය හා සම්බන්ධ වන ආකාරය පැහැදිලි කරන්න.

ආ. චාරිත්‍ර හා වාරිත්‍ර සීලය හඳුන්වන්න.

ඉ. හිරි ඔතප් දෙක සීලයෙහි පදනම ලෙස සැලකීමේ හේතු යුක්ති සහගත බව දක්වන්න.

## 2004

(1)අ. නිති පන්සිල් හා පොහොය අටසිල් සමාදන් වන ගෘහස්ථයාගේ දෛනික දිවි පැවැත්ම පිළිබඳව කෙටි සටහනක් ලියන්න.

## 2003

(1)අ. හික්මීම හෙවත් ශීලය අංශ දෙකකින් යුක්තය ඉන් එක් අංශයක් හඳුන්වන්න.

ආ. සීලය පුද්ගල ප්‍රභේද අනුව කොටස් කරන්න.

ඉ. සීලයෙහි ප්‍රධාන අරමුණු පුද්ගලයාගේ අභ්‍යන්තර ශික්ෂණය ඇති කිරීමයි සාකච්ඡා කරන්න.

## 2001

(1)අ. සීලය හෙවත් හික්මවීම සඳහා වන ධමර්තා දෙක ලියා ඉන් එකක් හඳුන්වන්න.

ආ. අත්තානුවාද භය පරානුවාද භය යන දෙකෙන් එකක් පැහැදිලි කරන්න.

ඉ. පාපකර්මයන්ගෙන් පුද්ගලයා වළකාලීමට මෙම භය හේතුවන අයුරු විස්තර කරන්න.

## 1999

(2)අ. බෞද්ධයාගේ අවසාන අරමුණ විමුක්ති සුවය ළඟා කර ගැනීමට ක්‍රියා කිරීමයි,ඒ සඳහා අවශ්‍ය පියවර තුන ලියන්න.

ආ. එම පියවර තුනෙන් එකක් ගැන කෙටි හැඳින්වීමක් කරන්න.

ඉ. මධ්‍යම ප්‍රතිපදා මාගර්ය ගැන විස්තරයක් කරන්න.

## 1997

(1)අ. සතර සංවර සීලය නමින් හැඳින්වෙන සීලයේ ප්‍රභේද හතර නම් වශයෙන් දක්වන්න.

ආ. එම හතරෙන් එක් ශීලයක් සැකෙවින් හඳුන්වන්න.

ඉ. සීලයට පදනම් වන හිරි ඔතප් දෙක සදාචාර ලෝකයේ පැවැත්මට උපකාරී වන අයුරු පැහැදිලි කරන්න.

## 1996

(1)අ. සීලය හෙවත් හික්මවීම පිණිස හේතුවන ධමර්තා දෙක නම් කරන්න.

ආ. ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න.

ඉ. මෙම ධමර්තා දෙකෙන් තොරවීම අපරාධ වැඩිවීමට හේතුවන අයුරු පැහැදිලි කරන්නන.